# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2112/25 - 2019 පෙබරවාරි මස 28 වැනි බ්‍රහස්පතින්දා - 2019.02.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2017 අංක 12 දරන විදේශ විනිමය පනත

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වැනි වගන්තිය සමග කියවිය යුතු, 29 වැනි වගන්තිය යටතේ සාදන ලද නියෝග.

අදාළ රේඛීය අමාත්‍යාංශයෙහි සහ අදාළ වෙනත් ඕනෑම අධිකාරයක අනුමැතියට යටත්ව ශ්‍රී ලංකා රජයට සහ ශ්‍රී ලංකා රජය සතු ව්‍යවසායයන්ට (රජය සතුව 50%ට අධික කොටස් ප්‍රාග්ධනය සහිත), ලබාගන්නා ණය මුදල්, ණය ලබා දෙන්නාගේ ආමුඛ ආයෝජන ගිණුම හරහා යොමු කිරීමකින් තොරව, නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් වලින්, ශ්‍රී ලංකාවට පරිබාහිරින් ණය ලබා ගැනීමට මෙයින් අවසර දෙනු ලැබේ. එවැනි ණය ලබා ගැනීම් පිළිබඳ විස්තර, ශ්‍රී ලංකාවට එම ණය ලබා දීමෙන් මාසයක කාලයක් ඇතුළත මුදල් අමාත්‍යාංශයෙහි (අදාළ පරිදි) විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් විදේශ විනිමය දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂ වෙත වාර්තා කළ යුතු ය.

මංගල සමරවීර,
මුදල් අමාත්‍ය.

2019 පෙබරවාරි මස 27 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

03 - 697

1A - PG 4405 — 542 (2019/02)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.